### විශේෂ සටහන 8

## විදේශීය අංශයේ තුලනය ශක්තිමත් කිරීම සඳහා පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා

**හැඳින්වීම**

ද්විත්ව හිඟය ලෙස ප්‍රචලිත, රටක ධාරිතාවට වඩා සහ ඊට ඉහළින් අධික ලෙස වියදම් කිරීම නිසා ඇතිවන අසමතුලිතතාවයන් තුළින් ඇති වන රජයේ අයවැය සහ විදේශීය ජංගම ගිණුමේ සමගාමී හිඟයන් පැවතීමේ සංසිද්ධිය, අවුරුදු ගණනාවක් පුරා ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන ව්‍යුහාත්මක බාධාවක් වන අතර, සාර්ව ආර්ථිකයේ ඇති අවදානම් සඳහා ප්‍රධාන සාධකයකි. ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් වෙළඳ භාණ්ඩ ගිණුමෙහි සහ ප්‍රාථමික ආදායම් ගිණුමෙහි වසර ගණනාවක් තිස්සේ පවතින විශාල හිඟයන් හේතුවෙන් ඇතිවන අඛණ්ඩ විදේශීය ජංගම ගිණුමේ හිඟයන් අත්විඳිමින් සිටී. සේවා වෙළඳාම් ගිණුමේ සහ ද්විතීයික ආදායම් ගිණුමේ (ප්‍රධාන වශයෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සමන්විත) අතිරික්තයන් වාර්තා කළද, මෙම අතිරික්තයන් ජංගම ගිණුමේ වෙළඳ භාණ්ඩ සහ ප්‍රාථමික ආදායම් ගිණුම්වල නිරන්තරයෙන් පුළුල් වන හිඟයන්ගේ බලපෑම අවම කිරීමට ප්‍රමාණවත් නොවීය. තවද, ව්‍යුහාත්මක සහ ප්‍රතිපත්තිමය බාධාවන් හේතුවෙන් පශ්චාත් යුධ සමයේ පවා අපේක්ෂිත මට්ටම දක්වා විදේශීය සෘජු ආයෝජන වැනි ණය නොවන විදේශීය මූල්‍ය ප්‍රවාහයන් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාව අසමත් විය. එපමණක් නොව, පසුගිය දශකය තුළ දී රටේ ඉහළ ගිය විදේශීය ණය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන විශාල ණය සේවාකරණ ගෙවීම්, රටේ ණය තිරසාරභාවය පිළිබඳ ගැටලු තීව්‍ර කරමින් විදේශීය අංශයේ අසමතුලිතතාවයන් ඇති කිරීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. විදේශීය අංශයේ මෙම ව්‍යුහාත්මක දුර්වලතා මධ්‍යයේ, රාජ්‍ය මූල්‍ය අංශයේ විචක්ෂණශීලි නොවන හා නිරන්තරයෙන් වෙනස්වන ප්‍රතිපත්ති, කොවිඩ්-19 වසංගතය සහ ඒ ආශ්‍රිත අවිනිශ්චිතතාවයන් සාර්ව ආර්ථික දුර්වලතා තීව්‍ර කරමින් ව්‍යසන මාලාවක් ඇති කළේය. 2022 වසරේ අප්‍රේල් මස වන විට ද්‍රවශීලී සංචිත ප්‍රමාණය ශූන්‍ය මට්ටමට ආසන්න වීමත් සමඟ දළ නිල සංචිත ඉතිහාසයේ පැවති අවම මට්ටම්වලට පහත වැටුණු අතර, 2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකය විශාල ලෙස ඉහළ ගියේය. මෙම ප්‍රවණතා හමුවේ, රජය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් අපේක්ෂාවෙන්, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී අතුරු කාලසීමාවක් සඳහා ණය සේවාකරණය නතර කිරීමක් නිවේදනය කළ අතර, ජා.මූ. අරමුදල සමඟ මූල්‍ය පහසුකමක් ලබා ගැනීමේ වැඩපිළිවෙළක් සඳහා සාකච්ඡා ආරම්භ කළේය. ශ්‍රී ලංකාවේ ණය තිරසාර නොවන බව තක්සේරු කර ඇති බැවින්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළෙහි සාර්ථකත්වය රඳා පවතිනුයේ පවතින ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය මතය. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ පරාමිතීන් ශ්‍රී ලංකාවේ නිල සහ පෞද්ගලික ණය හිමියන් සමඟ සාකච්ඡා කර එකඟ වූ පසු, ශ්‍රී ලංකාවට වඩා දිගු කල්පිරීමක් සහිත කුඩා පරිමාණයෙන් ණය සේවාකරණ ගෙවීම් නැවත ආරම්භ කරනු ඇත. මෙම ප්‍රථම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රයත්නය, අතීතයේ සිදු කළ වැරදි නිවැරදි කර ගැනීමටත්, ඇතැම් රටවල් අත්විඳින පරිදි නැවත නැවතත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැටසටහන් වෙත යොමු වීමෙන් රට පීඩාවට පත් නොවීම සහතික කිරීම සඳහා තීරණාත්මක ලෙස අනාගත ක්‍රියාමාර්ග සැලසුම් කිරීමටත්, නැවත හිමි නොවිය හැකි වටිනා අවස්ථාවක් ලබා දෙනු ඇත. රටේ රාජ්‍ය මූල්‍ය හා විදේශීය තත්ත්වයන් ශක්තිමත් කිරීමට සහ ඉදිරි කාලසීමාව තුළ අභියෝගවලට මුහුණ දීමේ හැකියාව ගොඩනඟා ගැනීම සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය පමණක් නොව, පශ්චාත් ප්‍රතිව්‍යුහගත ආර්ථිකයේ ඉදිරි මාවත හොඳින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු බව මෙයින් අවධාරණය කෙරේ.

**ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙහි අභියෝග**

1950 වසරේ සිට 2010 වසර දක්වා රටවල් 95ක් සම්බන්ධව ගෝලීය වශයෙන් ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සිදුවීම් 600කට වැඩි ප්‍රමාණයක් සිදු වී ඇත (Das, Papaioannou, & Trebesch, 2012). සාමාන්‍යයෙන්, සාර්ථක ණය ප්‍රතිව්‍යුහගතකරණයකින් පසු රටක් තිරසාර ලෙස ඉදිරියට ණය කළමනාකරණය කර ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, සාර්ථක ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියකින් පසු සිය ණය තිරසාර ලෙස කළමනාකරණය කර ගැනීමට ඉහත සියලු රටවල් සමත් නොවූ අතර, එසේ අසමත් වූ රටවලින් පසුව තවදුරටත් ණය පැහැර හැරීම් වාර්තා විය. ඇතැම් රටවල් ණය ප්‍රතිව්‍යුහගත කිරීම හරහා ඔවුන්ගේ ආර්ථික වර්ධනයෙහි විභව මට්ටමට ළඟා වීමට සහ විදේශීය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීමට අපොහොසත් වීමට හේතු කිහිපයක් ඇති අතර, පහත විස්තර කර ඇති පරිදි දැක්විය හැකිය.

1. **අහිතකර ආර්ථික තත්ත්වයන්:** නැවත ගොඩනැඟීමේ අදියරේ දී රටක බාහිර පරිසරය සහ පුළුල් ආර්ථික තත්ත්වයන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලය තීරණය කිරීමට ඉතා වැදගත් වේ. නිදසුනක් වශයෙන්, පශ්චාත් ප්‍රතිව්‍යුහගතකරණ අවධිය තුළ ගෝලීය ආර්ථිකය මන්දගාමී වුවහොත් හෝ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් ආර්ථික සංකෝචනයකට මුහුණ දෙන්නේ නම්, රටක ආර්ථික වර්ධනයෙහි විභව මට්ටම සහ ගෙවුම් තුලනයේ තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීමට අපහසු විය හැක.

5

ශ්‍රී ලංකාවේ පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ අවධියේ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම අභියෝගයට ලක් කරමින් දැඩි මුදල් ප්‍රතිපත්ති හා මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන් මධ්‍යයේ, 2023 වසරේ දී ගෝලීය ආර්ථික ආතතීන් ඉහළ යා හැකි බවට පූර්ව ලක්ෂණ දක්නට ලැබේ.

2. **ක්‍රියාවට නැංවීමේ අභියෝග:** බාහිර ණයකරුවන්ගේ සහ ඔවුන්ගේ අවශ්‍යතාවල විවිධත්වය මෙන්ම භූ දේශපාලනික අවශ්‍යතා අනුව, ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ අදියර සංකීර්ණ විය හැක. මෙමගින්, ණය හිමියන් සමග එකඟතාවයකට එළඹීම අභියෝගාත්මක විය හැකි අතර, එමගින් සාකච්ඡා දීර්ඝ වීම තුළින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීමේ අවදානම ඉහළ යා හැකිය. බොහෝ කල්ගත වන ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියකින් ආයෝජකයින්ගේ විශ්වාසය තවදුරටත් පළුදු විය හැකි අතර විදේශීය අංශයෙහි ස්ථාවරත්වය නැවත ලබා ගැනීම සඳහා ප්‍රධාන දුෂ්කරතාවයක් විය හැකිය.

3. **ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවීම:** ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සාර්ව රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සහ අවශ්‍ය ගැලපීම් අවධාරණය කරමින්, කෙටිකාලීනව හා මැදි කාලීනව තිරසාර වර්ධන මාවතක් කරා ආර්ථිකය ගෙන යන ප්‍රතිපත්ති සංකලනයක් අනුගමනය කිරීමට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ප්‍රතිපත්තිමය ප්‍රතිචාර ඵලදායි ලෙස සැලසුම් කර නොමැති නම් හෝ ක්‍රියාත්මක කිරීමේ දී සම්බන්ධීකරණය අවම නම්, අපේක්ෂිත ප්‍රතිඵලය ළඟා කර ගත නොහැක. ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මුහුණ දෙන ආවේණික ගැටලු සලකා බලන විට අවශ්‍ය ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ප්‍රමාණවත් තරම් ශක්තිමත් විය යුතුය.

4. **දේශපාලන අස්ථාවරත්වය:** ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියකින් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම රඳා පවතිනුයේ ණය හිමියන් සමග එකඟ වූ ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය සහ එහි දක්වා ඇති ඉලක්ක පිළිපැදීම මතය. ප්‍රධාන ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා ගත යුතු තීරණ, ජනප්‍රිය තීරණ නොවන නිසා රජයන් එවැනි ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමේ දී දැඩි පීඩනයකට ලක් වනු ඇති අතර, ඇතැම් විට ඡන්දදායකයක්ගේ බලපෑම්වලට ඉඩදීමට සිදුවිය හැකිය. දේශපාලන ස්ථාවරත්වයක් පැවතීම, ආයෝජකයින්, බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික ණය දෙන්නන් සහ ණයහිමියන් ඇතුළු පාර්ශ්වකරුවන් අතර ආර්ථිකය පිළිබඳ විශ්වාසය යළි ගොඩනැංවීමට උපකාරී වනු ඇත. තවද, දේශපාලන අස්ථාවරත්වය ප්‍රතිපත්තිමය අසංගතතාවයට හේතු විය හැකි අතර, එය තිරසාර සාර්ව ආර්ථික ගැලපීම් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල බාධාවක් විය හැක. මේ අනුව, පශ්චාත් ප්‍රතිව්‍යුහගත ආර්ථික පුනර්ජීවනය මෙන්ම ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව, දේශපාලන ස්ථාවරත්වය අඛණ්ඩව පවත්වාගෙන යෑම මෙන්ම ප්‍රතිසංස්කරණ සඳහා මහජන සහයෝගය මත තීරණය වනු ඇත.

5. **දුර්වල ආයතන:** දුර්වල ආයතන නීතියේ ආධිපත්‍යය පිරිහීමට, විනිවිදභාවය හා වගවීම නොමැති වීමට සහ දූෂණය වැඩි වීම හේතු වන අතර, ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ඵලදායීතාවය සීමා කරමින් සහ ආයෝජකයන්ගේ විශ්වාසය පළුදු කරමින් ආර්ථික වර්ධනයට අහිතකර පරිසරයක් නිර්මාණය කළ හැක.

මෙම පසුබිම තුළ, ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කරන අතරම විදේශීය අංශයේ ස්ථාවරත්වයක් ඇති කිරීම අරමුණු කරගත් ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් සැකසීම යෝග්‍ය වේ. ඒ අනුව, අනාගතයේ දී නැවත නැවතත් ජ.මූ. අරමුදලේ ණය ආධාර ලබා ගැනීමේ සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම් සඳහා ප්‍රවේශ වීමේ අවශ්‍යතාවයන් වැළැක්වීමට නම් හැකි ඉක්මනින් අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමටත්, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ ණයහිමියන් විසින් ලබා දෙන ණය සහන කාලය අවසන් වී ණය වගකීම් නැවත ගෙවීම ආරම්භ වන අවස්ථාව වන විට ඇතිවන මූල්‍යකරණ අවශ්‍යතාවන් සපුරා ගැනීමේ මූලාග්‍ර පිළිබඳවත් රජය පැහැදිලි උපාය මාර්ගයක් ප්‍රකාශ කළ යුතුය. රටක සාර්ව ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ළඟා කර ගැනීම සඳහා විදේශීය අංශයේ ස්ථිර ස්වාරක්ෂක ගොඩනැගීම ඉතා වැදගත් වේ. එවැනි ස්වාරක්ෂක, මනා සම්බන්ධීකරණයකින් යුතු ජාතික ප්‍රතිපත්ති ප්‍රවාහයක් තුළින් විදේශීය ජංගම හා මූල්‍ය ගිණුම ශක්තිමත් කිරීම මෙන්ම අයවැය හිඟය හා විදේශීය ජංගම ගිණුමේ හිඟය ණය ලබා ගැනීම් තුළින් මූල්‍යකරණය කිරීම යන දිශානතියෙන් ඉවත් වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය හැකිය.

**විදේශීය ජංගම ගිණුම ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රතිපත්ති**

අධි තක්සේරු වූ විනිමය අනුපාතිකය හා වෙළඳ අංශය වෙත ප්‍රමාණවත් ආයෝජන නොමැති වීම මධ්‍යයේ සීමිත විවිධාංගීකරණය, අවම අගය එකතු කිරීම, ගෝලීය අගය දාමයන් සමග ඒකාබද්ධ වීම මන්දගාමී වීම සහ තරඟකාරීව සිටීමට අවශ්‍ය සංකීර්ණත්වය නොමැතිකම වැනි අවේනික ගැටලු හේතුවෙන් පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ අපනයන අඛණ්ඩ හෝ ඉහළ වර්ධනයක් ලබා ගැනීමක් දක්නට නොලැබුණි. මේ අතර, ප්‍රධාන වශයෙන් විදේශීය

5

අංශයේ ණය ගැනීම් හරහා මූල්‍යකරණය කරන ලද සියලුම වර්ගයේ ආනයන සඳහා වන වියදම් වඩා වැඩි වේගයකින්, විශේෂයෙන්ම 2011 වසරේ සිට ඉහළ යෑම වෙළඳ හිඟයන් පුළුල් වීමට හේතු විය. ඒ අනුව, විදේශීය ජංගම ගිණුමේ හිඟය පියවා ගැනීමේ ඕනෑම ප්‍රයත්නයක්, සේවා ගිණුමේ අතිරික්තය ඉහළ නංවන අතරම වෙළඳ භාණ්ඩ අපනයන ආදායම ඉහළ නැංවීමේ සමගාමී ක්‍රියාමාර්ග මගින් වෙළඳ හිඟය අඩු කිරීම කෙරෙහි අවධානය යොමු කරන උපායමාර්ග විය යුතුය. ආනයන තාර්කිකරණය සහ ආනයන ආදේශනය සඳහා වන ප්‍රයත්නයන් හරහා ඉල්ලුම් කළමණාකරණ ක්‍රියාමාර්ග හඳුන්වා දිය හැක්කේ තාවකාලික පදනමක් මත ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කර ගැනීම සඳහා පමණක් වන අතර, එවැනි ක්‍රියාමාර්ග දිගු කාලීනව අනුගමනය කිරීමෙන් ආර්ථිකයේ තරගකාරීත්වය දුර්වල විය හැක. තවද, නවෝත්පාදන සඳහා වන පර්යේෂණ හා සංවර්ධනය තුළින් නිෂ්පාදන විවිධාංගීකරණය, සිරස් සහ තිරස් ඒකාබද්ධ වීම, කොටස් වශයෙන් නිෂ්පාදනය කිරීමේ ජාලයන්ට සහභාගී වීම සහ උපාංග නිෂ්පාදනය හරහා ගෝලීය අගය දාම වෙත ඇතුළත් වීම මෙන්ම නව වෙළඳපොළ ගවේෂණය කිරීම මගින් අපනයන ගමනාන්තයන් ලෙස සාම්ප්‍රදායික වෙළඳපොළ මත අධික ලෙස රඳා පැවතීම අඩු කිරීම යනාදිය වැදගත් ක්‍රියාමාර්ග ලෙස සැලකිය හැක. විශේෂයෙන්ම, නම්‍යශීලී විනිමය අනුපාතිකයක්, ස්ථාවර බදු හා ආයෝජන ප්‍රතිපත්ති, මිල ස්ථායිතාව හා එමගින් අඩුවෙන් උච්චාවචනය වන පොලී අනුපාත ව්‍යුහයක් සහ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් පවත්වා ගැනීම වැනි හිතකර සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මගින් අපනයන අංශයට සහාය විය හැකිය. ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා ජාතික අපනයන ක්‍රමෝපායේ දක්වා ඇති ක්‍රියාමාර්ග කඩිනමින් සහ බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම, එහි අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. ඒකාබද්ධ කිරීම් හරහා ආනයන ඵලදායී ලෙස ආදේශ කරන අතර, අපනයන අංශයේ දේශීය අගය එකතු කිරීම ඉහළ නැංවීමට ප්‍රධාන අපනයන සඳහා අවශ්‍ය අන්තර් භාණ්ඩ සපයන දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. නිදහස් වෙළඳ ගිවිසුම් තුළින් සමාන අවස්ථාවන් නිර්මාණය කිරීම අමතර වාසිදායක තත්ත්වයක් වනු ඇත. තවද, පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ක්‍රියාමාර්ග තුළින් මැදි හා දිගුකාලීනව ෆොසිල ඉන්ධන මත රඳා පැවැත්ම අඩු කරන අතර, එය ඉන්ධන ආනයනය මගින් ජංගම ගිණුමට ඇති කරන පීඩනය අවම කිරීමට උපකාරී වනු ඇත.

මේ අතර, විදේශීය ජංගම ගිණුමේ හිඟය පියවීම සඳහා සේවා අපනයන අත්‍යවශ්‍ය වන බැවින් එවැනි සේවා අපනයනවල පවතින පූර්ණ විභවය උකහා ගැනීම අත්‍යවශ්‍ය වේ. විශාලම සේවා අපනයන අංශය වන සංචාරක අංශය යථා තත්ත්වයට පත් වීමේ ලකුණු පෙන්නුම් කරන අතර, සංචාරක කර්මාන්තයෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සුවිශේෂී සහ සාම්ප්‍රදායික නොවන සංචාරක වෙළඳපොළ සහ විවේකය සඳහා සංචාර හැර වෙනත් හේතු සඳහා සංචාරය කරන සංචාරකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙන පරිදි සංචාරක අංශය විවිධාංගීකරණය කිරීම අත්‍යවශ්‍ය වේ. එසේම, ශුද්ධ විදේශ විනිමය රට වෙත ගලා ඒමට ඇතැම් සේවා අපනයන විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශයට සැලකිය යුතු හැකියාවක් ඇත. කොවිඩ්-19 වසංගතයෙන් පසු ලොව පුරා ආර්ථිකයන්හි ඩිජිටල්කරණය වැඩි වීමත් සමග තොරතුරු තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශවල වර්ධන ඉඩ ප්‍රස්ථා පුළුල් වී ඇත. එබැවින්, ශ්‍රී ලංකාව ඩිජිටල්කරණයට ලක් වූ රටක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා රටෙහි පුහුණු ශ්‍රම බලකායක් සිටීම සහ නවීන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වලින් සමන්විත වීම යන කරුණු ප්‍රයෝජනයට ගත යුතුය. එසේම, මෙම අංශයේ වර්ධනයට සමගාමීව අවශ්‍ය කෙරෙන මානව ප්‍රාග්ධන සංවර්ධනය කිරීම සහ වෙළඳපොළ ඉල්ලුමට ගැළපෙන පරිදි ද්විතීයික සහ තෘතීයික තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය හැඩගැස්වීම කළ යුතු වේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමග ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ද පහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, පොලී නොවන ආදායම් ගිණුමේ අතිරික්තයක් ඇති කිරීම අවශ්‍ය වේ.

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශ රැකියා ප්‍රවර්ධනය, විදේශ රැකියා වෙළඳපොළ විවිධාංගීකරණය කිරීම සහ ඉහළ ඉපැයුම් හැකියාවක් සහිත රැකියා අවස්ථා වැඩි ප්‍රමාණයක් සුරක්ෂිත කර ගැනීමට සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ කුසලතා ඉහළ නැංවීම සහ අඩු පිරිවැයකින්, තත්කාලීනව හා පහසුවෙන් දේශසීමා හරහා අරමුදල් ප්‍රවාහ ගමන් කිරීමට පහසුකම් සැලසීම මගින් නිල ප්‍රේෂණ ප්‍රවාහයන් දිරිමත් කිරීම සඳහා පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරී දායකත්වය අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව පසුගිය කාලයේ මැදපෙරදිග කලාපයෙන් ලබාගත් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් ප්‍රතිලාභ ලබා ඇතත්, විශේෂයෙන්ම දකුණු කොරියාව, සිංගප්පූරුව, ජපානය සහ යුරෝපීය රටවල් වැනි පුළුල් පරාසයක විවිධ රැකියා සඳහා ඉහළ වැටුප් විභවයක් සහිත දියුණු ආර්ථිකයන් විකල්ප ගමනාන්තයන් ලෙස ප්‍රවර්ධනය කිරීම කාලෝචිත වන අතර, එමගින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රමාණය ඉහළ යෑම මෙන්ම ප්‍රේෂණ ලැබීම්වල හු දේශපාලනික වශයෙන් ඇතිවන අවදානම් අවම වීම ද සිදු වේ. මේ අතර, ශ්‍රී ලංකාවෙන් වෘත්තිකයන් විශාල ලෙස ස්ථිර පදනමක් මත සංක්‍රමණය වීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ

ප්‍රේෂණවලට අහිතකර ලෙස බලපෑම මෙන්ම බුද්ධි ගලනය හේතුවෙන් දිගුකාලීන ආර්ථික ප්‍රතිවිපාකවලට ද හේතු විය හැකි බැවින්, ඒ සඳහා කඩිනමින් විසඳුම් සෙවිය යුතුය.

**විදේශීය මූල්‍ය ලැබීම් ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රතිපත්ති**

ඉහළ විදේශීය ජංගම ගිණුම් හිඟය පියවා ගැනීම සඳහා ඉලක්කගත ක්‍රියාමාර්ගයන්ට අමතරව, විදේශීය ඍජු ආයෝජන සහ විවිධ ආයෝජන වැනි ණය නොවන ප්‍රාග්ධන ලැබීම් ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම තුළට වැඩි වශයෙන් ආකර්ශණය කර ගනිමින්, විදේශීය අංශයේ ඉහළ ස්ථාවරත්වය මෙන්ම වැඩිදියුණු කළ සාර්ව ආර්ථික ස්ථායීතාවය සහතික කිරීම අවශ්‍ය වේ. අඛණ්ඩ විදේශ විනිමය ණය සේවාකරණ අවශ්‍යතා සහ ණය ආපසු ගෙවීම සඳහා රාජ්‍ය මූල්‍ය අවකාශය අඩු වීම හමුවේ විදේශීය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා විදේශීය අංශය අවදානම් සඳහා මුහුණ දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට, ඉදිරියේ දී ණය නොවන විදේශීය මූල්‍ය ලැබීම් ආකර්ෂණය කර ගැනීම දැඩි අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. ජංගම ගිණුමේ හිඟය පියවීමට සහ දේශීය ආයෝජන වැඩි කිරීමට සහාය දැක්වීමට අමතරව, විවිධ අංශ සඳහා තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීම, ව්‍යාපාර පුළුල් වීම සඳහා සහාය වීම සහ විදේශ වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම හරහා ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා වැඩිදියුණු කරවීම යනාදිය තුළින් විදේශීය ඍජු ආයෝජන ආර්ථික වර්ධනයට දායක වේ. සමහර නීතිමය, ව්‍යුහාත්මක සහ ආයතනික දුර්වලතා, එනම් දැඩි ශ්‍රම වෙළඳපොළ නීති, උපයෝගීතා ලබාගැනීමේ අපහසුතා, සංකීර්ණ සහ අස්ථාවර බදු ව්‍යුහයන්, විශේෂයෙන්ම කොන්ත්‍රාත් බලාත්මක කිරීම, ආනයන අපනයන ලියකියවිලි අවශ්‍යතා, ව්‍යාපාර ආරම්භ කිරීම, දේපළ අත්පත් කර ගැනීම යනාදිය සම්බන්ධයෙන් පවත්නා සංකීර්ණ නියාමන ව්‍යුහයන් සහ හොඳින් සංවර්ධිත යටිතල පහසුකම් නොමැතිකම හේතුවෙන් පසුගිය දශක කිහිපය පුරා ශ්‍රී ලංකාවේ විදේශීය ඍජු ආයෝජන ලැබීම් කලාපීය සම රටවල් සමඟ සසඳන විට ඉතා පහළ මට්ටමක පැවතුණි. මෙම සාධක හැරුණු විට, ප්‍රතිපත්ති අවිනිශ්චිතතාවය, සිදුවිය හැකි වංචා දූෂණ සහ දුර්වල සම්බන්ධීකරණය වැනි ආයතනික සහ පාලන දුර්වලතා ශ්‍රී ලංකාව තුළ හිතකර ආයෝජන වාතාවරණයක් ඇති කිරීමට අඛණ්ඩව බාධා පමුණුවා ඇත. එබැවින්, ආයෝජකයන්ගේ විශ්වාසය වර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකාව පුළුල් ආයෝජන ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවමින් විනිවිදභාවයකින් යුතු සහ ඵලදායී ප්‍රතිපත්තිමය රාමුවක් ස්ථාපිත කළ යුතු අතර, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මානව නිපුණතා සහ ආයතනික හැකියාවන් ගොඩනඟා ගැනීම සිදු කළ යුතුය. වෙළඳ හා කාර්මික ප්‍රතිපත්ති වැනි අනෙකුත් සංවර්ධන ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සමඟ විදේශීය ආයෝජන ප්‍රතිපත්තිය ඒකාබද්ධව ක්‍රියාවට නැංවීම මෙන්ම, මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණය ද එක සේ වැදගත් වේ. ආර්ථික වර්ධනයට දායක වීමෙන් පමණක් නොව සමස්ත ආර්ථිකයටම කාර්යක්ෂම ප්‍රතිලාභ අත්කරගැනීම සඳහා සාර්ව-රාජ්‍ය මූල්‍ය ගැළපුම් වැඩසටහන යටතේ ආර්ථිකයට මැදි කාලීන සිට දිගු කාලීනව යථා තත්ත්වයට පත් වීම සඳහා විදේශීය ඍජු ආයෝජන සහ ඒ හා සබැඳි ප්‍රතිලාභ උපකාරී වනු ඇත. මෙම ගැටලු නිරාකරණය කිරීම සඳහා අදාළ බලධාරීන් දැනටමත් ප්‍රයත්න දරා ඇති අතර, ගෝලීය විදේශීය ඍජු ආයෝජන ප්‍රවාහයන් පූර්ව වසංගත මට්ටම්වලට නැවත ළඟාවීමට පෙරාතුව මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම අත්‍යවශ්‍ය වේ.

වාණිජ ව්‍යාපෘති මූල්‍යනය සීමා කිරීම සහ ණය සේවාකරණය සඳහා විදේශ විනිමය උත්පාදනය කළ හැකි වෙළඳාම් අංශ සඳහා මූල්‍යන අවස්ථා දිරිගැන්වීම ද අවශ්‍ය වේ. ණය ගැනීම්වල ඵලදායී ප්‍රයෝජනය ඉහළ නැංවීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සහ රටේ විදේශ සංචිත වෙත පීඩනය අවම කිරීම සඳහා විදේශීය ණය ගැනීම්, ඒවායේ භාවිතය සහ ආර්ථික බලපෑම් සම්බන්ධයෙන් මහජනතාවට විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කරන අතරම, පැහැදිලි සහ විනිවිදභාවයෙන් යුත් ඇගයීම් සහ තේරීම් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. තවද, විදේශීය ණය ගැනීම් හා සම්බන්ධ ඉහළ අවදානම් වාරික අඩු කිරීම සඳහා ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගයක් ගොඩ නැගීම අවශ්‍ය වේ. එසේ වුවද, ඉදිරි කාලය තුළ රටේ ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු වන බැවින්, සමස්ත ණය කළඹ තුළ වාණිජ ණය කොටස වැඩි කිරීමේ ප්‍රවණතාව වැළැක්විය යුතුය. බලශක්ති සහ ආහාර සුරක්ෂිතතා, දේශගුණික අනුගත වීම වැනි අත්‍යවශ්‍ය ව්‍යාපෘති සඳහා අඩු පිරිවැයක් සහිත අරමුදල් විකල්පයන් තුළින් ගෝලීය වශයෙන් පුළුල් ලෙස ලබා ගත හැකි තිරසාර මූල්‍යන විකල්පයන් පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයන් කිරීම මෙන්ම හරිත මූල්‍යන විකල්පයන් භාවිතා කිරීම ප්‍රයෝජනවත් වේ. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් දළ නිල සංචිත ගොඩනැගීමට අවශ්‍ය විදේශීය අරමුදල් රටට ආකර්ෂණය කර ගැනීම සඳහා සහාය වන වෙළඳපොළ අපේක්ෂාවන් වැඩිදියුණු කිරීමට අවස්ථාව හිමි වේ. 2032 වසර වන විට රජයේ ණය මට්ටම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 95ට වඩා අඩු කිරීම, 2027-32 වන කාලපරිච්ඡේදය තුළ දී මධ්‍යම රජයේ සාමාන්‍ය දළ මූල්‍යයන අවශ්‍යතාවය අඩු කිරීම වෙනුවෙන් ඉතා අපහසු තත්ත්වයන් යටතේ මූල්‍යනයන් නැවත ලබා ගැනීමේ අවදානම් කළමනාකරණය කළ හැකි වන පරිදි අවිනිශ්චිත වගකීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13කට අඩු මට්ටමක තබා ගැනීම 2027-32 වන කාලපරිච්ඡේදය තුළ ඕනෑම වසරක දී මධ්‍යම රජයේ විදේශ විනිමය ණය සේවාකරණය කිරීම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක්

ලෙස සියයට 4.5කට අඩුවෙන් තබා ගැනීම, රාජ්‍ය මූල්‍ය හා විදේශීය මූල්‍යන හිඟය පියවීම සහතික කිරීම යනාදී මධ්‍යම හා දිගු කාලීන ඉලක්ක ළඟා කරගනිමින් බලධාරීන් විසින් ණය තිරසාරභාවය අත්කර ගැනීම අවශ්‍ය වේ.

**සමාප්තිය**

ඉහත කරුණු සලකා බැලීමේ දී, වත්මන් ආර්ථික අර්බුදයෙන් ස්ථිරසාරව නැවත යථා තත්ත්වයට පත්වීම උදෙසා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ දී කෙටි කාලීනව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම පමණක් නොව පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගත කිරීම් සහ පශ්චාත් ජා.මූ. අරමුදලෙහි පහසුකම් අවධිය තුළදීත් ප්‍රමාණවත් ආරක්ෂාවන් සහ අභියෝගවලට මුහුණ දීමේ හැකියාව සහිතව රට යළි ගොඩනැඟීම සඳහා යොමුවීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව අත්විඳින අඛණ්ඩ ද්විත්ව හිඟය අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර සකස් කරන ලද හා වෙනස්වන දේශපාලන පාලන තන්ත්‍රවල බලපෑම්වලින් මිදුණු පුළුල් ජාතික ප්‍රතිපත්ති පැකේජයක් හරහා ගොඩ නැගෙන තිරසාර පදනමක් මත ගෙවුම් තුලන ගැටලු විසඳීමේ වැදගත්කම ඉස්මතු කරයි. තවද, වාණිජමය විදේශීය ණයවලින් ජංගම ගිණුමේ හිඟය පියවීමේ අවශ්‍යතාවය අවම කරන අතරම, ණය නොවන විදේශ විනිමය උත්පාදන මූලාශ්‍ර ගවේෂණය කර දිරිමත් කළ යුතුය. එසේම, ජාත්‍යන්තර අත්දැකීම්වලට අනුව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ ඉන්පසු ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ ප්‍රතිඵලවල ප්‍රධාන නිර්ණායකය වන්නේ ප්‍රතිසංස්කරණ වැඩසටහනේ සාර්ථකත්වය සඳහා බලධාරීන්ගේ කැපවීම් මට්ටමයි. එසේම, රජයේ අයවැය හිඟයන් සහ විදේශීය ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීමේ සංයුතිය ඉදිරි කාලසීමාව තුළ ණය නොවන මූල්‍යන තුළින් සිදු නොවන්නේ නම්, ඉදිරි ගමන සඳහා අනිවාර්ය කොන්දේසි වන ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ඇති ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සහ සාර්ව-රාජ්‍ය මූල්‍ය ගැළපුම් වැඩසටහන ඇතුළුව ආර්ථික ප්‍රශ්න විසඳීමට දැනට දරණ අඛණ්ඩ උත්සාහයන් තුළින් පමණක් රටේ ගැඹුරින් මුල් බැසගත් ව්‍යුහාත්මක දුර්වලතා සහ සාර්ව ආර්ථික සංකූලතා සඳහා ස්ථිර විසඳුමක් සහතික නොකරනු ඇත.

**මූලාශ්‍රය**

1. Das, U., Papaioannou, M., & Trebesch, C. (2012). 'Sovereign Debt Restructurings 1950-2010: Literature Survey, Data, and Stylized Facts'. IMF Working Paper, IMF.

5